# 1. දිවැස් වැකි හා කිතු උපත

**දෙවියන් වහන්සේ ජනතාවට දේව පණිවුඩය ලබා දීම සඳහා විශේෂාකාරයෙන් තෝරා ගත් පුද්ගලයන් විවිධ යුගවල දී කැඳවනු ලැබූ සේක. දිවැසිවරුන් ලෙස හැඳින්වූ මොවුන් ජනතාවට පිළිගැන්වූ දේව පණිවුඩ අතර අනාගත සිදුවීම් හා සම්බන්ධ අනාවැකි ද විය.**

**යෙසායා 7:14, 11:1, 9:2, 6, 7 මීකා 5:2**

| දිවැසිවරයා යනු | දිවැසිවර කාර්යය වූයේ |
|---|---|
| දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ, දේවාත්මානුභාවයෙන් එළිදරව් කරන ලද දේව පණිවුඩය ජනතාවට පිළිගැන්වූ තැනැත්තා ය. | දේව ජනතාව දෙවියන් වහන්සේගෙන් ඈත් ව පව්ටු ජීවිත රටාවකට යොමු වූ විට එසේ වීමට මුල් වූ කරුණු විමසා බලා අඳමිටු බවින් ජනතාව මුදවා නැවත උන්වහන්සේ වෙත ගෙන ඒම යි. |

කිතු උපත සිදුවීමට බොහෝ කලකට පෙර සිටම ඒ සම්බන්ධයෙන් අනාගත වාක්‍ය ලෙස හඳුන්වනු ලැබූ දිවැස් වැකි ප්‍රකාශ වී තිබුණි.

ජනතාව අධ්‍යාත්මික හා සමාජමය වශයෙන් විවිධ දුක් කම්කටොළුවලට මුහුණ දෙමින් සිටි ඒ සමයේ කිතු උපත පිළිබඳ දිවැසිවරුන් ප්‍රකාශ කර තිබූ දිවැස් වැකි එම ජනතාවට මහත් අස්වැසිල්ලක් වන්නට ඇත.

### අපි එවැනි දිවැස් වැකි කිහිපයක් සලකා බලමු.

**බලන්න. කන්‍යාවක්<br>පිළිසිඳ ගෙන<br>පුත්‍රයකු බිහිකරන්නී ය.<br>එම්මානුවෙල් යන නම<br>ඔහුට තබන්නී ය.<br>යෙසායා 7:14**

**මෙන්න, කන්‍යාවක් ගැබ් ගෙන<br>පුතකු බිහි කරන්නී ය.<br>උන්වහන්සේට<br>එම්මානුවෙල් යන නාමය<br>තබනු ඇත.<br>ශු. මතෙව් 1: 23**

මරියා නම් ආශිර්වාද ලත් කන්‍යාව ගැබ් ගෙන පුත්‍රයකු බිහිකිරීමේ සිද්ධිය කිතු උපත සිදුවීමට බොහෝ කලකට පෙර ප්‍රකාශ කරන ලද දිවැස් වැකිය සම්පූර්ණත්වයට පත් වීමකි. එසේ උපදින දරුවාට **එම්මානුවෙල්** යන නාමය තැබිය යුතු බව ඉන් ප්‍රකාශ විය. එහි අර්ථය "**දෙවියන් වහන්සේ අප සමග ය.**" යන්න ය. එම උපත මුළු මානව වර්ගයාට ම සුභාරංචිය වූ අතර ඔවුන්ට ගැළවීම අත්කර දුන් දිව්‍යමය ක්‍රියාවලිය බව ද පැහැදිලි වේ.

**දාවිත්ගේ රාජ පෙළපත**
**නැමති වෘක්ෂයෙන්**
**රාජාංකුරයක් හට ගන්නේ ය.**
**එහි මුල්වලින් අලුත් පැලයක්**
**නැගී එන්නේ ය.**
**යෙසායා 1191**

**උන්වහන්සේ ශ්‍රේෂ්ට වන සේක.**
**පරමෝත්තමයාණන්ගේ**
**පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක.**
**උන්වහන්සේගේ පිය වූ**
**දාවිත්ගේ සිංහාසනය**
**දෙවි ස්වාමින් වහන්සේ උන්වහන්සේට**
**ප්‍රදානය කරන සේක.**
**ලූක් 1:32**

දෙවි සමිඳාණන් විසින් දාවිත්ට දුන් පොරොන්දුව මෙම දිවැස් වැකියෙන් ප්‍රකාශ වේ. එදා ජුදයේ බෙත්ලෙහෙම නම් දාවිත්ගේ නුවර දාවිත්ගේ පෙලපතින් සිදු වූ කිතු උපත යෙසායා දිවැසිවරයාගේ අනාවැකිය සම්පූර්ණත්වයට පත් වීමකි. මින් දෙවියන් වහන්සේගේ සැලැස්ම ආරම්භයේ සිට ම ක්‍රියාත්මක වූ බවත් එය එලෙසින් ම සම්පූර්ණ වූ බවත් පැහැදිලි ය.

**අන්ධකාරයේ ඇවිද්ද**
**සෙනඟ මහත්**
**ආලෝකයක් දුටුවෝ ය.**
**ඝනඳුරු දේශයේ විසූ**
**අය කෙරෙහි එළියක්**
**දැන් බබලන්නේ ය.**
**යෙසායා 9:2**

**ඝනඳුරේ කල් යැවූ**
**සෙනඟ මහත් එළියක්**
**දුටහ. මරණ අඳුර ඇති**
**දේශයෙහි**
**වෙසෙන්නවුන්ට එළිය**
**උදා විය.**
**ශු. මතෙව් 4:16**

**අඳුරේ හා මරණ**
**සෙවනේ සිටින්නවුන්**
**කෙරෙහි එලෙසින්**
**එළිය උදාකරවමින්**
**සෙත් මග යාමට අපට**
**මග පෙන්වන සේක.**
**ශු. ලූක් 1:79**

කිතු උපත සිදුවන කාලය වන විට ජුදා සමාජය ද අදමිටු බව නැමති අඳුරෙන් වැසී ගොස් තිබුණි. දිගු කාලයක් අධිරාජ්‍ය පාලනයට යටත් ව සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් දිළිඳු බවත් අසහනයත් වර්ධනය වී ජනතාව දැඩි පීඩනයට පත් ව සිටියහ. තවද, කාන්තාවන්, දරුවන්, රෝගීන්, වහලුන්, අන්‍ය ජාතීන් වැනි අය පව්කරුවන් ලෙස සලකා සමාජයෙන් නිසි තැන නොලද හෙයින් ඔවුන් පසු වූයේ දැඩි අසහනයකිනි. මෙලෙස "ඝනඳුරු දේශයේ" විසුවන්ට ආලෝකයක් වන්නට ජේසුස් වහන්සේට හැකි විය. ඒ තුළින් දිවැසිවරයා ප්‍රකාශ කළ අනාවැකිය සම්පූර්ණ විය.

**අපට ළදරුවෙක් උපන්නේ ය**
**අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය.**
**එතුමාණෝ අපේ රජු වන සේක.**
**එතුමාණෝ**
**අසිරිමත් උපදේශකයාණෝ ය.**
**ප්‍රතාපවත් දෙවි තුමාණෝ ය.**
**සදාතන පියාණෝ ය.**
**සාමයේ කුමාරයාණෝ යයි**
**කියනු ලබන්නෝ ය.**
**යෙසායා 9:6**

**මේ බලන්න ඔබ පිළිසිඳ ගෙන**
**පුත්‍රයකු ලබන්නෙහි ය.**
**උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න.**
**උන්වහන්සේ ශ්‍රේෂ්ට වන සේක.**
**පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු**
**ලබන සේක. උන්වහන්සේ පියවූ දාවිත්ගේ**
**සිංහාසනය**
**දෙවි ස්වාමින් වහන්සේට ප්‍රදානය**
**කරන සේක.**
**ලූක් 1:31-32**

පැමිණෙන්ට සිටින තැනැන්වහන්සේගේ **ශ්‍රේෂ්ටත්වය** පිලිබඳ පැහැදිලි කළ දිවැසිවර යෙසායාගේ අනාවැකිය පසු ව දේව දූතයා විසින් කිතු උපත මරිය තුමියට දැනුම් දීමේ දී පැවසූ වචනවලින් ද අනාවරණය විය. එමෙන්ම උන්වහන්සේගේ ජීවිතාදර්ශය හා මෙහෙවර තුළින් මෙම දිවැස්වැකි අර්ථවත් ව සම්පූර්ණ විය.

**එතුමාණෝ යුක්තියෙන් ද**
**ධර්මිෂ්ටකමින් ද**
**රජකම් කරන සේක.**
**යෙසායා 9:7**

**උන්වහන්සේ ජාකොබ්ගේ වංශය**
**කෙරෙහි සදහටම රජකම් කරන සේක.**
**උන්වහන්සේගේ රාජ්‍යය කෙලවරක්**
**නොදක්නේ ය.**
**ලූක් 1:33**

මෙම වදන්වලින් පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේගේ රාජ්‍යය තුළ දක්නට ලැබෙන වටිනාකම් ද උන්වහන්සේ තුළින් පිළිබිඹු වූ ගුණාංග ද ප්‍රකාශ විය. **යුක්තිය** හා **ධර්මිෂ්ටකම** ඒ ගුණාංග අතර ප්‍රධාන වේ. එතුමාණෝ සකල ජනතාවගේ රජ වන්නේ බලයෙන් නොව යුක්තියෙන් ය. සියල්ලන්ගේ උපදේශකයා වන්නේ සාධාරණත්වයෙන් ය. මෙලෙස උන්වහන්සේ අපගේ සාමයේ කුමාරයාණන් ලෙස සදාකාලික ව ගෞරවයට පාත්‍ර වන සේක.

**එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා,**
**තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප**
**වන්නේ ය. එහෙත් ඉශ්‍රාරායෙල්**
**කෙරෙහි අධිපතියා වීමට කෙනෙක්**
**තී කෙරෙන් නැගී එන්නේ ය.**
**එතුමන්ගේ පෙළපතේ මුල**
**ධුරාතීතයෙන් ද පැරණි යුගයෙන් ද**
**එන්නේ ය.**
**මීකා 5 : 2**

**මෙසේ ආබ්‍රහම් පටන් දාවිත් දක්වා**
**පරම්පරා සියල්ල දස සතරකි.**
**දාවිත් පටන් බැබිලෝනියේ**
**විප්‍රවාස ගත වීම දක්වා**
**පරම්පරා දස සතරකි.**
**බැබිලෝනියේ විප්‍රවාස ගත වීමේ**
**කාලයේ පටන්**
**ක්‍රිස්තුස් වහන්සේ දක්වා**
**පරම්පරා දස සතරකි.**
**මතෙව් 1 : 17**

මීකා දිවැසිවරයා ප්‍රකාශ කළ මෙම දිවැස් වැකියෙන් ද ඉශ්‍රායෙල් හී අධිපතීත්වය දැරීමට පැමිණෙන තැනැන්වහන්සේගේ උපත හා උන්වහන්සේගේ පෙළපත පිළිබඳ ව ප්‍රකාශ වේ. එනම් දෙවියන් වහන්සේගේ තෝරාගත් ජනතාව අතරින් අධිපතියෙක් පහළ වන බව ය. ඒ බව සනාථ කරමින් කිතු උපත සිදු විය. මෙලෙස ප්‍රකාශිත දිවැස්වැකි කිතු උපත තුළින් සම්පූර්ණත්වයට පත් විය. දේව සැලැස්මට අනුකූල ව සිදු වූ කිතු උපත තුළින් ඉශ්‍රායෙල් පමණක් නොව මුළු මානව වර්ගයාට විමුක්තිය අත් කර ගන්නටත් එ මගින් නව ලොවක් ගොඩ නගන්නටත් හැකි විය.

ක්‍රියාකාරකම

1. දිවැසිවරු මගින් ඉටු වූ කාර්යභාරය පැහැදිලි කරන්න.

2. දිවැස් වැකි මගින් පළ වූ ජේසුස් වහන්සේගේ
   (අ) උපතෙහි සුවිශේෂීභාවය (උපත හා පෙළපත)
   (ආ) උන්වහන්සේගේ මෙහෙවර පහදන්න.